සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/01/circular
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2023.03.16

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>2017 අංක 02 දරන දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 44 (ඉ) ii වගන්තිය යටතේ වූ සේවකයන් විසින් රජයට ආපසු ගෙවිය යුතු මුදල් සම්බන්ධවයි.</u>**

සමෘද්ධි පනතේ 44 (ඉ) ii වගන්තිය යටතේ අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් විසින් අධිකාරී සේවා කාලයට අදාලව ලබාගෙන ඇති සේවක අර්ථසාධක අරමුදලේ 60 % ක් වූ රජයේ දායකත්වය හා අධිකාරී කාලයට අදාළව පාරිතෝෂික මුදලක් ලබාගෙන ඇත්නම් එම මුදල ද සමග මුළු මුදල රජයට ආපසු ගෙවිය යුතුය.

02. මෙම මුදල් ආපසු ගෙවීම් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයට අංක අමප/23/0075/629/001/ දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. ඒ සම්බන්ධයෙන් 2023.02.20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලබාදුන් තීරණයට අනුව සමෘද්ධි පනතේ 44 (ඉ) ii වගන්තිය යටතේ දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහනය වීමට මනාපය පළ කළ නිලධාරීන් විසින් අධිකාරී සේවයට බැඳුණු මුල් දින සිට සේවක අර්ථසාධක අරමුදලේ ගිණුම අවසන් කරණ දිනට පැවති සම්පූර්ණ මුදලින් රජයේ දායකත්වය හා ඊට අදාල පොලිය ද සමහ 60%ක් වූ මුදල ද පාරිතෝෂික දීමනාවක් ලබා ගෙන ඇත්නම් එම සම්පූර්ණ මුදල හා සේවක අර්ථසාධක අරමුදලින් කපා හැර ඇති ණය මුදලක් වේ නම් එම ප්‍රමාණයද සමග මුළු මුදල විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට නොහැකි වන්නේ නම් විශ්‍රාම ගැන්වීමේ දිනය වන විට තම පෞද්ගලික මුදලින් ගෙවන ලෙසට නිලධාරියාට දැන්වීම සඳහා වන යෝජනාව සඳහා අනුමැතිය ලබා දී ඇත.

03. ඒ අනුව ඔබ දිස්ත්‍රික්කයේ සේවය කරන සමෘද්ධි පනතේ 44 (ඉ) ii වගන්තිය යටතේ වූ මුල් සේවා නිලධාරීන් විසින් ඉහත පරිදි රජයට ආපසු ගෙවිය යුතු මුදල විශ්‍රාම පාරිතෝෂිකයෙන් හිලව් කර ඉතිරි මුදලක් වේ නම් ඔවුන් විසින් තම පෞද්ගලික මුදලින් විශ්‍රාම ගැන්වීමේ දිනය වන විට ගෙවා අවසන් කරන කළ යුතුය. එසේ වුවද විශ්‍රාම යාමට ප්‍රථම තමා විසින් රජයට ගෙවිය යුතු මුදලින් යම් මුදල් ප්‍රමාණයක් ගෙවීමට හැකි නිලධාරීන් වේ නම් ඔවුනට ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා දැනුවත් කිරීමක් කරණ ලෙසත් කාරුණිකව දැනුම් දෙමි.

ආර්.පී.ජී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:-

1. ලේකම් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. ප්‍රධාන ගණකාධිකාරී - අ.කා.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැ.ගැ.ස
4. සියළුම අංශ ප්‍රධානීන් - අ.කා.ස.
5. සියළුම වෘත්තීය සමිති ලේකම්වරුන් - දැ.ගැ.ස හා අ.කා.ස.

1ෙන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General — Tel- 011-2872202, Fax - 011-2889002, E-mail- dgsamurdhi@gmail.com

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) — 011-2873799, 011-2873996, diradmin@samurdhi.gov.lk, Hot Line :0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant — 011-2869742, 011-2869742, finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) — 011-2889003, 011-2887469, Hot Line:0112-885582

කාර්යාලය / அலுவலகம் / Office — 0112872202, Hot Line: 011- 2887722